# ශ්‍රී ලංකා ඉහල පෙලේ නියෝජිත පිරිසක් ඉන්දුනීසියානු සමාජ ආරක්ෂණ පද්ධතිය අධ්‍යනය කරයි.

ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ සහය ඇතිව මෙම අධ්‍යනය සංවිධානය කල අතර ජපන් රජයද ඒ සදහා දායකත්වය ලබා දී ඇත.

මෙම ත්‍රෛපාර්ශ්වික ඉහල පෙලේ නියෝජිත පිරිස කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශයේ ලේකම් ආර්. පී. ඒ. විමලවීර මහතාගේ ප්‍රධානත්වයෙන් 2023 සැප්තැම්බර් 4 සිට 7 දක්වා ඉන්දුනීසියාවේ සිව්දින අධ්‍යයන චාරිකාවක නිරත විය.එම සංචාරයේදී අවධානය යොමු වූයේ ඉන්දුනීසියාවේ සමාජ ආරක්ෂණ පද්ධතිය පිළිබද සාර්ථක ඉගෙනුම් ගවේෂණය කෙරෙහි අවධානය යොමු කරමින් විශේෂයෙන් එරට ස්ථාපිත විරැකියා ආරක්ෂණ යෝජනා ක්‍රමය කෙරෙහි වැඩි අවදානයක් යොමු කරන ලදි.

ශ්‍රී ලංකාවේ ස්ථාපිත කිරීමට නියමිත ජාතික විරැකියා ආරක්ෂණ යෝජනා ක්‍රමය පිහිටුවීම සඳහා මෙම අධ්‍යන අත්දැකීමෙන් ලබා ගත් දැනුම මහෝපකාරී වන අතර එම මුලපිරීම රට තුළ වඩාත් ඔරොත්තු දෙන සහ සමානාත්මතාවයෙන් යුත් ශ්‍රම වෙළඳපොළක් හැඩගැස්වීමේදී ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරනු ඇත.

වර්තමාන අභියෝග බොහොමයක් විශ්වීය වීමත් සමඟ, කලාපීය ඉගෙනුම් අත්දැකීම් දේශසීමා විසඳුම් වලින් ඇදීමට මෙන්ම ජාතික සන්දර්භයන්ට ගැළපෙන පරිදි ඒවා ගොඩනැගීමට සහ අනුවර්තනය කිරීමට ඉඩ සලසයි. විරැකියා ප්‍රතිලාභ, රැකියා හදිසි අනතුරු වන්දි සහ වැඩිහිටියන් සඳහා විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ ඇතුළු ශ්‍රමය සම්බන්ද නොයෙකුත් අංශ ආවරණය වන වැඩසටහන් මාලාවක් ඉදිරිපත් කරමින් පුළුල් සමාජ ආරක්ෂණ ආයතනයක ප්‍රධාන උදාහරණයක් ලෙස පෙනී සිටින ආයතනයක් වන ඉන්දුනීසියාවේ BPJS Ketenagakerjaan විසින් මෙම අධ්‍යයන චාරිකා වැඩසටහන පවත්වන ලදී.

මෙම ත්‍රෛපාර්ශ්වික නියෝජිත පිරිස කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය, කම්කරු දෙපාර්තමේන්තුව, ලංකා සේවා යෝජකයින්ගේ සම්මේලනය (EFC) සහ ශ්‍රී ලංකා නිදහස් සේවක සංගමය (SLNSS) සහ ලංකා කම්කරු කොංග්‍රසය (CWC) ඇතුළු වෘත්තීය සමිති නියෝජිතයන්ගෙන් සමන්විත විය.

ගෝලීය වශයෙන් ගත් කල ලොව පුරා රැකියා විරහිත ශ්‍රමිකයින්ගෙන් සියයට 18.6 කට පමණක් විරැකියාව සඳහා ඵලදායී ආවරණයක් ඇති අතර එය සමාජ ආරක්ෂණයේ අවම සංවර්ධිත ශාඛාව ලෙස පවතී (ලෝක සමාජ ආරක්ෂණ වාර්තාව 2020 - 2022).

විරැකියා ආරක්ෂණ යෝජනා ක්‍රම පුළුල් සමාජ ආරක්ෂණ පද්ධති සඳහා ඉතා වැදගත් වේ. ජපාන රජයේ අනුග්‍රහය යටතේ 'ආසියානු සහ පැසිෆික් කලාපයේ සමාජ ආරක්ෂණය සම්බන්ද පුළුල් ව්‍යාපෘතියේ (SSN අරමුදල) ආධාර ඇතිව ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ ශ්‍රී ලංකා කාර්යාලය විසින් ක්‍රියාත්මක කරන ලද 'ශ්‍රී ලංකාවේ විරැකියා ආරක්ෂණ යෝජනා ක්‍රමය සංවර්ධනය කිරීමේ' ව්‍යාපෘතිය මගින් අධ්‍යයන චාරිකාව සඳහා අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන සඳහා සහයෝගය ලබා දෙන ලදි.

*ජාත්‍යන්තර කම්කරු සංවිධානය යනු වැඩ ලෝකය සඳහා වන එක්සත් ජාතීන්ගේ විශේෂිත වූ ආයතනයයි. එය ජාත්‍යන්තර කම්කරු ප්‍රමිතීන් සකස් කිරීම, තාක්ෂණික සහාය ලබා දීම, සහ රැකියා, කම්කරු අයිතිවාසිකම් සහ සමාජ ආරක්ෂණය සම්බන්ධ දැවෙන ගැටළු විසඳීම සඳහා ප්‍රතිපත්ති සංවාදයන්හි නිරත වේ. ජාත්‍යන්තර කම්කරු සංවිධානය , සමාජ සාධාරණත්වය ඉදිරියට ගෙන යාම සහ ලොව පුරා සුනිසි වැඩ ප්‍රවර්ධනය කිරීමේ මෙහෙවර සාක්ෂාත් කර ගැනීම සඳහා රාජ්‍ය ආයතන , සේවා යෝජකයින්ගේ සහ කම්කරු සංවිධාන සහ අනෙකුත් පාර්ශවකරුවන් සමඟ සමීපව කටයුතු කරයි.*